සියළුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
*All Rights Reserved*

# බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## වර්ෂ අවසාන ඇගයීම - 2012

## 11 - ශ්‍රේණිය

## කතෝලික ධර්මය - පිළිතුරු පත්‍රය

### I පත්‍රය

| | | | |
|---|---|---|---|
| 1 - 2 | 11 - 2 | 21 - 3 | 31 - 4 |
| 2 - 4 | 12 - 1 | 22 - 4 | 32 - 1 |
| 3 - 3 | 13 - 4 | 23 - 3 | 33 - 4 |
| 4 - 1 | 14 - 2 | 24 - 1 | 34 - 4 |
| 5 - 4 | 15 - 4 | 25 - 2 | 35 - 2 |
| 6 - 4 | 16 - 3 | 26 - 3 | 36 - 1 |
| 7 - 3 | 17 - 2 | 27 - 1 | 37 - 2 |
| 8 - 1 | 18 - 1 | 28 - 3 | 38 - 4 |
| 9 - 4 | 19 - 3 | 29 - 2 | 39 - 1 |
| 10 - 2 | 20 - 1 | 30 - 3 | 40 - 3 |

(ලකුණු 1 X 40 = 40)

### II පත්‍රය

01. 1. බුද්ධිය, අමරණීයත්වය, නිදහස, හෘදයසාක්ෂිය, ප්‍රඥාව වැනි ආධ්‍යාත්මික ලක්ෂණ දෙකක්

2. මරියතුමියගේ උදානගීය - සකරියස්තුමාගේ ප්‍රශංසා ගීය - සිමියොන් තුමාගේ උදාන ගීය

3. ලේනෑකම - මිශ්‍ර ආගම් - ඥාන මව්පිය නෑකම - වයස අඩුවීම

4. පූජාත්වරය හා ආශිර්වාදකාර බන්ධනය

5. සෑම ඉරුදිනයක්ම - පරිශුද්ධ දේවමාතාවන්ගේ මංගල්‍යය - ජනවාරි 01
දේවමාතාවන් පරලොවට වැඩිය මංගල්‍යය - අගෝස්තු 15
දේවමාතාවන් නිර්දෝෂව පිළිසිඳීමේ මංගල්‍යය - දෙසැම්බර් 08
නත්තල් මංගල්‍යය - දෙසැම්බර් 25

6. දෛනික ජීවිතයේ කාර්යයන් නිසා යාච්ඤාවට කාලය යොදා නොගැනීම - යාච්ඤා කිරීමට ඇති අකැමැත්ත - කාලය වැයකර යාච්ඤා කලද ඉන් ඵලක් නැති බව සිතීම - යාච්ඤා කලද නොකලද දෙවියන් වහන්සේගෙන් සියල්ල ලැබෙන බව සිතා සිටීම.

7. එකිනෙකාට
    1. විශ්වාසවන්තවීම
    2. ප්‍රේම කිරීමට
    3. ගෞරව කිරීමට

8. (යෙසායා 42/ 1-4, 6-7) අනුව ලක්ෂණ දෙකක් ශුද්ධාත්මානුභාවයෙන් පූර්ණ වී ඇත - සැමදෙන හට යුක්තිය ගෙන දෙනු ඇත. - එතුමා ප්‍රසිද්ධියට අකැමැතිය - අසරණයන් තවත් පීඩාවට පත් නොකරයි. - තම සේවය කිරීමේදී අධෛර්ය නොවේ. (මෙවැනි ගුණාංග දෙකක්)

9. මතෙව් සුවිශේෂය හා ලූක් සුවිශේෂය

10. සුරදූත නිකායික කන්‍යා සොයුරියෝ - රොසේරියන් පියතුමන්ලා - රොසේරියන් කන්‍යා සොයුරියෝ - ගිහි අපෝස්තලික කණ්ඩායම්

(ලකුණු 2 X 10 = 20)

02. 1. මිනිසා තුළ පවතින දේව සමාන කමේ ලක්ෂණ දෙකක් මැවිල්ල මත අධිකාරි බලය - සදාතන ජීවිතය සඳහා කැඳවීම ආදී ගුණාංග දෙකක්

2. නූතන තාක්ෂණය යොදා ගැනීමේදී නිතරම දේව මහිමය ප්‍රකාශ වන සැටියටත් - මිනිසාගේ අභිවෘද්ධිය හා ප්‍රයෝජනය සඳහා යොදා ගැනීමටත් - නව නිර්මාණ මිනිසාගේ මෙන්ම පරිසරයට අයහපත් නොවන අයුරින් නිපදවීම වැනි කරුණු අඩංගු වනසේ කරුණු තුනක්.

3. හෘදය සාක්ෂිය යනු දේව සමානකමේ ලක්ෂණයකි. දෙවියන් වහන්සේව මුණගැසෙන ස්ථානයයි - යහපත හා අයහපත තේරුම් කරදෙන දේව හඬයි - නිවැරදි තීරණ ගැනීමට උපකාරී වේ - හෘදය සාක්ෂියට කීකරු වීම තුළින් යහපත උදාවේ - හෘදය සාක්ෂියට පිටුපා කටයුතු කිරීමෙන් අඳුරුවිය හැක - අඳුරුවී ගිය හෘදය සාක්ෂිය නැවත නිවැරදි කර ගැනීමට අවශ්‍ය වේ. (මෙවැනි කරුණු 05) (ලකුණු 2+3+5 = 10)

03. 1. දෙවියන් වහන්සේ ආදිමවුපියන්, නෝවා, ආබ්‍රහම් හා මෝසස් සමග ගිවිසුමෙන් බැඳුණු සේක.

2. ගිවිසුම් ජීවිතය මතක් කරදීම - ජනතාවගේ හෘදය සාක්ෂිය නිවැරදි කරදීම - ගැලවුම්කරුවාණන්ගේ පැමිණීම ප්‍රකාශ කිරීම.

3. විවාහක යුවළ ජීවිතාන්තය දක්වාම
- අඹු සැමියන් ලෙස ජීවත්වීමට
- දුක්බර හා ප්‍රීතිමත් අවස්ථාවන්ට මුහුණ දීමට
- තමන් වෙත පැවරෙන වගකීම් ඉටු කිරීමට
- ප්‍රේමයෙන් හා විශ්වාසවන්තව විසීමට
- එකිනෙකාට අවංක වීමට හා විවෘතවීමට
- පතිවත හා පතිනිවත රැකගෙන විශ්වාසයෙන් ජීවත්වීමට
- එකිනෙකාට විරුද්ධව සිතින් - වචනයෙන් - ක්‍රියාවෙන් හෝ අතපසු කිරීමෙන් වරදක් නොකිරීමට
- විවාහයේ ශුද්ධවන්ත බව සුරැකීමට (ලකුණු 2+3+5 = 10)

04. 1. පරිසිවරයා හා අයකැමියා - වැන්දඹුව හා විනිශ්චයකාරයා - මහ රෑ පූප ඉල්ලූ මිත්‍රයා.

2. ස්වාමිවාක් ආරාධනාව
★ ක්‍රිස්තුන් වහන්සේ උගන්වා වදාළ යාච්ඤාවකි.
★ පියාණන් වහන්සේට ආමන්ත්‍රණය කරයි.
"ස්වර්ගයේ වැඩ සිටින අපගේ පියාණනි ......................"
★ ස්වාමින් වහන්සේගේ කැමැත්ත ඉටුවන ලෙස ඉල්ලයි.
★ පව්කමාව හා එදිනෙදා අවශ්‍ය භෝජනය ඉල්ලයි.
★ පාප පරීක්ෂා වලින් මුදා ගැනීමට ඉල්ලයි.
★ දේව කැමැත්ත මෙලොව ඉටුවන ලෙස ඉල්ලයි.

උත්තම පූජක යාච්ඤාව
★ ක්‍රිස්තුන් වහන්සේ විසින්ම කරන ලද යාච්ඤාවකි.
★ පියාණන් වහන්සේට ආමන්ත්‍රණය - "ඔබ මහිමයට පමුණුවනු ලබන පිණිස" යනුවෙනි.
★ තම දූත සේවාව නිමකර බාරදීමකි. තම අපෝස්තුළුවරුන් වෙනුවෙන්ද ඔවුන්ගේ සේවාව වෙනුවෙන්ද අයදියි.
★ දේව කැමැත්ත ඉටුකළ බව (තම සේවාව තුළින්) හා දේව මහිමය ප්‍රකාශ කරයි.
★ තම ශ්‍රාවකයන්, ශු. සභාව (සියලුම ජනතාව) වෙනුවෙන් පාප පරීක්ෂාවෙන් මිදීමට පිහිට අයදියි.
★ තම ශ්‍රාවකයන්ගේ සේවාව සඳහා වරප්‍රසාද අයදියි.
★ ක්‍රිස්තුන් වහන්සේ තම දේවපුත්‍රභාවය පැහැදිලිවම ප්‍රකාශ කළ එකම අවස්ථාවයි.

3. අසීසියේ ප්‍රැන්සිස් මුනිතුමාගේ යාච්ඤාවේ විශේෂ ගුණාංග
- අන් අය වෙත සාමය පැතිරවීමට කටයුතු කිරීම.
- අවිශ්වාස වූවන් වෙත විශ්වාසය ගොඩනැගීම.
- ජීවිතය පිළිබඳව බිඳවැටී බලාපොරොත්තුව නොමැති අය වෙත ජීවිතයට ශක්තිය, බලාපොරොත්තුව, ජීවනය ඇතිකරලීම.
- පීඩිතවූවනට, ශෝකවන්තයන් වෙත ප්‍රීතිය උදාකරලීම.
- පාපයේ වහල්කමින් යටවී සිටින අයගේ ජීවිත නවතාවයට පත් කරලීමට - ආලෝකය වෙත, දෙවියන් වෙතට හැරවීම.
- අන් අයව තේරුම් ගනිමින් - ඔවුනට ප්‍රේමය හා සැනසීම ලබා දීමට කටයුතු කිරීම.

(ලකුණු 2+3+5 = 10)

5. 1. ක්‍රියා 2/42-47 අනුව
ප්‍රේරිතවරුන්ගේ ඉගැන්වීම - සහභාගිකම - රොටී කැඩීම - දිනපතා යාච්ඤාවේ යෙදීම - සියල්ල පොදුවේ තබා ගැනීම වැනි ලක්ෂණ දෙකක්.

2. අපෝස්තුළුවරු දොළොස් දෙනාට දුන් බලතල
★ රෝග සුව කිරීමේ වරය
★ යක්ෂයන් කෙරෙහි අධිකාරි බලය
★ දේව රාජ්‍යය ප්‍රකාශ කිරීමේ බලය

3. පොදු පූජකවරය තුළ පැවරෙන කාර්යයන් (11 ශ්‍රේණිය - 119 පිටුව)
- හදිසි අවස්ථා වලදී ප්‍රසාද ස්නාපනය දානය කිරීම
- ජනවන්දනාවේ කියවීම් සඳහා දායකවීම
- පූදසුන් සේවය
- දිව්‍ය සත්ප්‍රසාද වන්දනාව පැවැත්වීම
- යාම යැදුම කියවීම
- දිව්‍ය සත්ප්‍රසාදය බෙදාදීම
- මෙහෙයයන් පැවැත්වීම
- සකුමේන්තු සඳහා අපේක්ෂකයින් සූදානම් කිරීම

(ලකුණු 2+3+5 = 10)

6. 1. සෘජුවම හෝ අනියම් ලෙස අන් අයගේ දේපළ, වස්තුව මෙන්ම පොදු දේපළ, කාලය, අන් අයගේ ශ්‍රමය ආදි දෑ වංචා සහගතව ලබා ගැනීම හා සොරකම් කිරීම. වැරදි ලෙස යොදා ගැනීමේ අවස්ථා දෙකකට ලකුණු දෙන්න.

2. අපට සාධාරණව වස්තුව ලබාගත හැකි ක්‍රම
★ අවංකව වැඩ කිරීමෙන්
★ මිලයට ගැනීමෙන්
★ හුවමාරුවෙන්
★ තෑගි වශයෙන්
★ උරුම වශයෙන්

3. අප සතු ධනය පරිහරණය කිරීමේදී සැලකිලිමත් විය යුතු කරුණු
ඕනෑම වස්තුවක් පෞද්ගලිකව අප සතුව පවත්නා අතර එය දෙවියන් වහන්සේට අයිතිවේ. අපි උන්වහන්සේගේ භාණ්ඩාගාරිකයෝද, ආරක්ෂකයෝද පමණක් වන්නෙමු.

එහෙයින්,
★ දේව අභිප්‍රායට එකඟව වස්තුව පරිහරණය කරමු.
★ පෞද්ගලික/ පොදු වස්තු යුක්ති ගරුකව වියදම් කරමු.
★ අසල්වැසියාගේ අවශ්‍යතා සඳහා උපකාර කරමු.
★ දේව රාජ්‍යයේ කාර්යයන් සඳහා උදව් උපකාර කරමු.
★ අපගේ උපකාර අවශ්‍ය අයට ත්‍යාගිවන්තව පරිත්‍යාග කරමු.
★ පොදු යහපත ගොඩනැගීමට, පොදු සේවාවන් සඳහා පරිත්‍යාග කරමු.

★ අරපිරිමැස්මෙන් හා සාධාරණවද යුක්තිගරුකවද අප - සතු ධනය පරිහරනය කිරීමට
වගබලා ගනිමු.
(මෙවැනි කරුණු මතුවන ආකාරයට ලියා ඇත්නම් ලකුණු දෙන්න)

(ලකුණු 2+3+5 = 10

07. කෙටි සටහන්

1. **පෘතුගීසි සමයේ ධර්මදූත වරුන්ගේ සේවය**
   - දුගී ජනයා අතරට ගොස් ජන ජීවිතයට සම්බන්ධ වී දහම කියා දීම.
   - සැම දෙනාටම එකලෙස සැලකීම.
   - සිංහල හා දෙමළ භාෂා ඉගෙන ගෙන ජනයාට දහම කියාදීම.
   - තම ජීවිත ආදර්ශය හා ප්‍රේමයේ ජීවිතය.
   - දහම් සේවය සඳහා ඔවුන් තුල තිබූ කැපවීම.
   - සමාජ සේවා ආයතන පිහිටුවා නොමිලේ සේවය ලබාදීම.
     උදා - අනාථ නිවාස, වැඩිහිටි නිවාස
   - අධ්‍යාපනය ලබාදීම නිසා වැඩවසම් ක්‍රමය නොමැතිවීම (වැනි ගුණාංග 5 වත් තිබිය
     යුතුය)

2. **මීසම තුල පූජක තුමාගේ සේවය**
   මීසම් භාර පියතුමකුගේ ප්‍රධාන කාර්යයන් වනුයේ ජනවන්දනාව පැවැත්වීම - ප්‍රසාද නිධාන දානය කිරීම - දහම් පාසල පවත්වා ගෙන යාම - මීසමේ ඇති විවිධ සේවාවන් සොයා බලා කටයුතු කිරීම වැනි දෑය. මීට අමතරව මිසම තුළ විශ්වාසිකයින්ගේ ආධ්‍යාත්මික පෝෂණය සඳහා කටයුතු කිරීම එතුමාගේ සතියේ වැඩ සටහනට අනුව රෝගීන්ට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේව ලබාදීම - සතියේ දිව්‍ය පූජාවන් පැවැත්වීම - මීසම් ජනතාව බැහැදැකීමට යාම වැනි ක්‍රියා දැක්විය හැක. (කරුණු 05 තිබිය යුතුය)

3. **නව ආදම්වූ ක්‍රිස්තුන් වහන්සේ**
   පැරණි ආදම් වූ මුල් මිනිසා භෞමිකය. ඔහු දෙවියන්ට අකීකරුවීම තුළින් පාපයට ගොදුරුවිය. මුළු මිනිස් සංහතියටම එම පාපය ව්‍යාප්ත විය. ලොවට ලෙඩරෝග, මරණය, වේදනාවන් ඔහු නිසා අත් විය.
   නව ගිවිසුමෙහි ආදම් ක්‍රිස්තුන් වහන්සේය. උන්වහන්සේ සවර්ගිකය. දේව කැමැත්තට අවනතවී ගැලවීමේ සැලැස්ම ක්‍රියාවට නැංවීම නිසා - එතුමන් තුළින් ලොවටම ගැලවීම - දේව සබඳතාව යළි උදාවිය. ඔහු ජීවදායකයෙකි. (මෙම කරුණු ඉස්මතු වන ලෙස ලියා ඇති කරුණු 05 ට ලකුණු දෙන්න)

4 **ස්වර්ග රාජ්‍යය වෙත මඟ දක්වන භාග්‍යයන්**
   ස්වර්ග රාජ්‍යය අපේක්ෂා කරන්නකු තුළ තිබිය යුතු ගුණාංග (සුදුසුකම්) හෙවත් නව ගිවිසුමෙහි ඉගැන්වෙන ස්වර්ග රාජ්‍යයේ ප්‍රඥප්තිය හෙවත් නීතිමාලාව වනුයේ භාග්‍ය අටය. මෙය මතෙව් හා ලූක් සුවිශේෂ වල සඳහන් වේ. මතෙව් සුවිශේෂයේ - කන්ද උඩ දේශනාව ලෙසින්ද ලූක් සුවිශේෂයේ තැනිතලා ස්ථානයේ දේශනය යනුවෙන්ද සඳහන් වේ. මතෙව් 5/1-12 හා ලූක් 6/20-23 කොටසෙහි දක්වා ඇත. ඒ අනුව මෙලොව ජීවිතය තුළ ගොඩනගා ගත යුතු යහ ජීවිත පැවැත්ම ප්‍රකාශ වන අදහස් පහකට ලකුණු දෙන්න.

5 **රෝගීන්ගේ ආලේපනය තුළින් රෝගියාට අත්වන ප්‍රතිඵල**
   රෝගින්ගේ ආලේපනය පිළිබඳව ජාකොබ් 5/13-16 හා ක.ස.ධ. 1421 සඳහන් වේ. ක්‍රිස්තුන් වහන්සේ තම දූත සේවාව තුළද බොහෝ අවස්ථාවල රෝගීන් සුවකර ඇත. එහෙයින් බරපතලව රෝගීවූ අයකු හෝ මහළු වයසේ පසුවන කිතුනුවකුට මෙය ලබා ගත හැක. මේ සඳහා ඔහුගේ සමීප වූවන් සහය විය යුතුය. රෝගීන්ගේ ආලේපනය ලැබීම තුළින් රෝගීන්ගේ මරණයට ඇති බිය - පාපවලට සමාව - ආත්ම ශක්තිය - වරප්‍රසාදීය ජීවිතය ලබා ගත හැකි වන අතර මානසික - සුවයක් සැලසේ. දේව කැමැත්ත අනුව සමහරවිට ශාරීරික සුවයද ලැබේ.
   (මෙවැනි කරුණු 05 විස්තර කර ඇත්නම් ලකුණු දෙන්න)

(තෝරා ගත් කෙටි සටහන් දෙකකට (5 x 2) ලකුණු 10